**“විදුශක්ති” - දකුණු පළාත් ආණ්ඩුකාරවර ශිෂ්‍යාධාර වැඩසටහන**

**ක්‍රියාත්මක කරනු ලබන පිළිවෙල හා අයදුම්පත සම්පූර්ණ කිරීමට අදාල උපදෙස්**

## 1. "විදුශක්ති" ශිෂ්‍යාධාර වැඩසටහනේ අරමුණු

1. 2023 වර්ෂයේ සිදුකරන ලද පාසල් ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් උසස් පෙළ විද්‍යා ගණිත විෂය ධාරාව ඉවත් කිරීම නිසා එම පාසල්වලින් අ.පො.ස සාමාන්‍ය පෙළ සමත්ව උසස් පෙළ ජීවවිද්‍යා හා ගණිතය විෂයධාරාවෙන් හැදෑරීම සඳහා වෙනත් පාසලකට ඇතුළත් වීමට සිදුවන ආර්ථික අපහසුතා ඇති සිසුන් වෙත ඔවුන්ගේ අමතර ගාස්තු දීමනා පියවා ගැනීමට මුල්‍ය දායකත්වය ලබා දීම තුලින් අදාළ පාසල්වල සිසු සිසුවියන් අඛණ්ඩව ජීව විද්‍යා හා ගණිත අංශවලින් උසස්පෙළ අධ්‍යාපනය හැදෑරීමට දිරිමත් කිරීම.
2. ආර්ථික දුෂ්කරතාවන් සහිත පවුල්වල සිසුන්ට උසස් පෙළ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආර්ථික ශක්තියක් ලබා දීම.
3. ආර්ථික දුෂ්කරතාවයක් පවතින පවුල්වල සිසුන් උසස් පෙළ විද්‍යා විෂයධාරාව හැදෑරීමට දිරිමත් කිරීම.
4. එම සිසුන් අඛණ්ඩව පාසල් පැමිණීම දිරිගැන්වීම.
5. සුවිශේෂී දක්ෂතා දැක්වූ සිසුන් අගය කිරීම
6. විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපනය දිරි ගැන්වීම

## 02. ශිෂ්‍යාධාර ලබාදීම සඳහා වර්ගීකරණය

පහත සඳහන් කාණ්ඩ යටතේ ඉහත ශිෂ්‍යාධාරය ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**01 කාණ්ඩය - පාසල් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ඉල්ලුම් කිරීම**

2023 වර්ෂයේ දකුණු පළාතේ පාසල්වල උසස් පෙළ විද්‍යා විෂයධාරාවේ සිදුකරන ලද ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ උසස් පෙළ විද්‍යා ගණිත විෂය ධාරාව ඉවත් කිරීම නිසා 2025 අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටීමේ අරමුණින් ජීව විද්‍යාව හා ගණිතය විෂයධාරාවන් හැදෑරීම සඳහා 2024 වර්ෂයේ 12 ශ්‍රේණියට වෙනත් පාසල් වෙත ඇතුළත් වීමට අඩු ආදායම්ලාභී/ආර්ථික අපහසුතාවයන් ඇති පවුල්වල සිසු සිසුවියන්.

**02 කාණ්ඩය - අඩු ආදායම්ලාභී/ආර්ථික අපහසුතාවයන් හේතුවෙන් ඉල්ලුම් කිරීම**

2022(2023) වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට 2025 වර්ෂයේ දී විද්‍යාව/තාක්ෂණවේදය විෂය ධාරාවලින් (ජීවවිද්‍යාව/ගණිත/තාක්ෂණවේදය) අ.පො.ස.(උ.පෙළ) හැදෑරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා මේ වන විට උක්ත විෂය ධාරාවකින් උසස් පෙළ හැදෑරීමට රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලකට ඇතුළත්ව සිටින/ඇතුලත් වීමට ඉල්ලුම් කොට තිබෙන අඩු ආදායම්ලාභී/ආර්ථික අපහසුතාවයන් ඇති පවුල්වල සිසු සිසුවියන්.

**03 කාණ්ඩය - සුවිශේෂී දක්ෂතා හා විශේෂ අවශ්‍යතා මත ඉල්ලුම් කිරීම**

විෂයධාරාව කුමක් වුව ද 2022(2023) වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට 2025 වර්ෂයේ දී අ.පො.ස. උසස් පෙළ හැදෑරීමට බලාපොරොත්තු වන දකුණු පළාතේ රජයේ හෝ අනුමත පෞද්ගලික පාසල්වල ඕනෑම ක්ෂේත්‍රයක් ඔස්සේ සුවිශේෂී කරුණු සහිත අඩු ආදායම්ලාභී/ආර්ථික අපහසුතාවයන් ඇති පවුල්වල සිසුන් හෝ විශේෂ අවශ්‍යතා සහිත සිසුන්.

## 03. ශිෂ්‍යාධාර හිමිකම් ලැබීම සඳහා අවශ්‍යවන මූලික සුදුසුකම්

1. අයදුම්කරු දකුණු පළාතේ පාසල් සිසුවෙකු විය යුතු ය.
2. 2022(2023) වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට 2025 වර්ෂයේ දී විද්‍යාව/තාක්ෂණවේදය විෂයධාරාවලින් (ජීවවිද්‍යාව/ගණිත/තාක්ෂණවේදය) අ.පො.ස.(උ.පෙළ) හැදෑරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා සිටින රජයේ පාසලක ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවක වීම හා උසස්පෙළ උක්ත විෂය ධාරාවකින් හැදෑරීමට රජයේ පාසලකට ඇතුළත්ව සිටින/ඇතුලත් වීමට ඉල්ලුම් කොට තිබෙන ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක විය යුතු ය.

   හෝ

3. 2023 වර්ෂයේ දකුණු පළාතේ පාසල්වල උසස් පෙළ විද්‍යා විෂයධාරාවේ සිදුකරන ලද ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ උසස් පෙළ විද්‍යා ගණිත විෂය ධාරාව ඉවත් කිරීම හේතුවෙන් විද්‍යා විෂය ධාරාව ඉවත් කළ පාසලක් (ඇමුණුම 02) මගින් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත්ව මේ වන විට අ.පො.ස උසස් පෙළ ජීව විද්‍යාව, ගණිතය හෝ තාක්ෂණවේදය විෂයධාරාව හැදෑරීම සඳහා වෙනත් පාසලක් වෙත ඇතුළත්ව/ ඇතුළත් වීමට අයදුම් කොට සිටිය යුතු ය.
4. ඕනෑම විෂය ධාරාවක් හදාරන්නේ නම් විශේෂ අවශ්‍යතා හෝ සුවිශේෂී කරුණු සහිත සිසුවෙකු විය යුතු ය.
5. අඩු ආදායම්ලාභී/ ආර්ථික අපහසුතා ඇති පවුලක සාමාජිකයෙක් විය යුතු ය. (ඒ බව සනාථ කිරීම සඳහා විධිමත් සහ පිළිගත් ලිපිලේඛණ ඉදිරිපත් කල යුතුවේ.)

6. රජය විසින් ලබාදෙන වෙනත් ශිෂ්‍යත්ව වැඩසටහනක් යටතේ ශිෂ්‍යාධාර නොලැබිය යුතු ය.

**04. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම හා ඉදිරිපත් කිරීම**

- අයදුම්පත භාර දීමේ දී සෑම අයදුම්කරුවෙක්ම මාසික ආදායම් ප්‍රකාශයට අදාළ තොරතුරු දෙමාපිය/භාරකරුගේ අත්සනින් සම්පූර්ණ කර, ග්‍රාම නිලධාරී සහතිකය සමග ඉදිරිපත් කල යුතු ය.
- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත අ.පො.ස (සා.පෙළ) හදාරන ලද පාසලේ විදුහල්පතිගේ නිර්දේශය සහිතව 2024.01.25 දිනට හෝ ඊට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ඔබ පාසල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලැබෙන පරිදි එම කාර්යාලය වෙත ගෙනවිත් භාර දී අයදුම්පත භාර දුන් බවට ලබා දෙන රිසිට් පත ලබාගත යුතු ය.
- කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සියලුම අයදුම්පත් දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය වෙත යොමු කරනු ඇත.
- අයදුම්පත් තෝරා ගැනීම සිදු වන්නේ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගිනි.
- 2024.01.25 දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.